සියළුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2
## Model Paper - 2

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - (80) 1 - පත්‍රය
## Information and Communication Technology - (80) Paper - 1

**කාලය පැය එකයි.** **One Hour.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා, ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ ඊට අදාල අංකය මත කතිරයක් (x) යොදන්න.
- 1 පත්‍රය සඳහා පැය එකක් (01) ද, 11 පත්‍රය සඳහා කාලය පැය දෙකක් (02) ද, වශයෙන් සම්පූර්ණ කාලය පැය තුන (03) කි.
- 1 සහ 11 පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වනසේ අමුණා භාර දෙන්න.

---

01. ICT යනු කුමන තාක්ෂණයන්ගේ එකතුවක් ද ?
    1. තොරතුරු තාක්ෂණය + පරිගණක තාක්ෂණය
    2. තොරතුරු තාක්ෂණය + සන්නිවේදන තාක්ෂණය
    3. අන්තර්ජාල තාක්ෂණය + සන්නිවේදන තාක්ෂණය
    4. අන්තර්ජාල තාක්ෂණය + පරිගණක තාක්ෂණය

02. පළමු පරිගණක ක්‍රමලේඛකයා/ලේඛිකාව වන්නේ කවුද ?
    1. පැස්කලයින්  2. චාර්ල්ස් බැබේජ්
    3. ඇඩා ඔගස්ටා ලව්ලේස්  4. හර්මන් හොලෙයිත්

03. ඇති විශාල ප්‍රමාණයේ සමෝධානික ක්‍රමය (VLIS) අයිතිවන්නේ කුමන පරිගණක පරම්පරාවටද ?
    1. පළමු පරම්පරාවට  2. දෙවන පරම්පරාවට
    3 තුන්වන පරම්පරාවට  4. හතරවන පරම්පරාවට

04. iPad පරිගණක වර්ගීකරණය වන්නේ ........................................................................................ යටතේය.
    1. පුද්ගලික පරිගණක  2. කුඩා ප්‍රමාණයේ පරිගණක
    3. ක්ෂුද්‍ර පරිගණක  4. විශේෂ වර්ගයේ පරිගණක

05. පහත දැක්වෙන ඒවා අතරින් ව්‍යුත්පන්න දත්ත සඳහා හොඳම උදාහරණය ලෙස ගත හැක්කේ
    1. නගර දෙකක් අතර දුර  2. පන්ති කාමරයක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව
    3. පුද්ගලයෙකුගේ උස  4. වයස් ගත කාන්තාවතගේ බර

06. චුම්භක, ප්‍රකාශ හා ස්ථිර යන ගති ස්වභාවය අනුව පහත දැක්වෙන අවයන උපාංග අනුපිළිවෙලින් නියෝජනය වන්නේ,
    1. නම්‍ය තැටි , සංයුක්ත තැටි , මතක චිප  2. නම්‍ය තැටි, ෆ්ලෑෂ් ධාවක, දෘඩ තැටි
    3. චුම්භක පටි , Blu–ray තැටි , Jazz Disc  4. සංයුක්ත තැටි, චුම්භක පටි, නම්‍ය තැටි

07. පහත දැක්වෙන ප්‍රකාශන සලකා බලන්න

A ස්ථිතික සසම්භාවී පිවිසුම් මතකය (SRAM) නශ්‍ය නොවන මතයක් වේ.

B ගතික සසම්භාවී පිවිසුම් මතකය (DRAM) නශ්‍ය මතකයක් වේ.

C ක්‍රමලේඛනය කළ හැකි පඨන මාත්‍ර මතකය (PROM) ,දත්ත යාවත්කාලීන කිරීම හා සංස්කරණය කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික ප්‍රතියෝජකය භාවිතා කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශන වන්නේ

1. A පමණි 2. B පමණි 3. C පමණි 4. B සහ C පමණි

08. සාමාන්‍යයෙන් මෙම කෙවෙනිය සම්බන්ධ කළ හැකි උපාංගය වන්නේ



1. LED මොනිටරය 2. තිත් න්‍යාස මුද්‍රකය

3. PS/2 උපාංග 4. ජාලකරණ ස්විචය

09. මෙම පරිගණක ජාල ස්ථලකයේ (Network Topology) නම කුමක්ද ?



1. මකුළු (Spider Topology) ජාල ස්ථලක
2. මුදු (Ring Topology) ජාල ස්ථලක
3. තරු (Star Topology) ජාල ස්ථලක
4. රුක් (Tree Topology) ජාල ස්ථලක

10. ඔබේ පාසල් පරිගණක විද්‍යාගාර පරිසරයේ ක්ෂුද්‍ර (Micro) පරිගණක 10 ක් ඇතැයි සිතන්න. මෙම පරිගණක ජාල ගත කිරීමට පහත දැක්වෙන ඒවායින් කුමක් අවශ්‍යවේද?

1. මොඩමය (Modem), වෙබ් ගවේශකයක් (Web Browser), නාභිය(Hub),
2. නාභිය(Hub), අන්තර්ජාල සේවා සපයන්නෙක් (ISP), මොඩමය (Modem)
3. ජාලකරණ අතුරුමුහුණත් කාඩ් පත (NIC), ඩොමේන් නාමය, මොඩමය (Modem)
4. ජාලකරණ ස්විචය, ඇඹරුම් යුගල රැහැන්(Twised pair cable), ජාලකරණ අතුරුමුහුණත් කාඩ් පත (NIC)

11. “යතුරු පුවරු සංඥා මාධ්‍ය සැකසුම් ඒකකයට යැවීම” මෙහි දත්ත සම්ප්‍රේෂණ ආකාරය හඳුනවන්නේ,

1. ඒක පථ (Simplex) දත්ත සම්ප්‍රේෂණය ලෙසය.
2. අර්ධ ද්විපථ (Half Duplex) දත්ත සම්ප්‍රේෂණය ලෙසය.
3. පූර්ණ ද්විපථ (Full Duplex) දත්ත සම්ප්‍රේෂණය ලෙසය.
4. ඉහත කිසිවක් නොවේ

12. පංති කාමරයක දිග සහ පළල අනුපිළිවෙලින් ඒකක 20 සහ 15 වේ. මෙම පංති කාමරයේ පරිමිතිය ද්විමය (Binary) අගයෙන් සොයන්න.

1. 01000110 2. 10010110 3. 01100011 4. 10101000

13. $P=31_8$ සහ $Q=11_8$ නම් P+Q හි අගයට සමාන වන්නේ

1. $(2^5) + (3^3)$ 2. $(5^2) + (3^2)$ 3. $(5^2) + (2^3)$ 4. $(5^2) + (3^3)$

14 0 හි ASCII අගය 0110000 නම් 5 හි ASCII අගය දශමය සංඛ්‍යාවෙන් සොයන්න.

1. 50 2. 51 3. 52 4. 53

15. පහත දැක්වෙන ඒවායින් BCD (Binary Coded Decimal) කේත ක්‍රමයට අදාල නොවන්නේ

1. 1000 සහ 1001 2. 0010 සහ 0011

3. 1010 සහ 1011 4. 0000 සහ 0001

ictnotes.org

16. මෙම තාර්කික ද්වාරවල ආදානය A සහ B ද ප්‍රතිදානය F ද වේ. මෙහි ප්‍රතිදානය සඳහා බූලියානු ප්‍රකාශනය ලියන්න.




1. A + B’ 2. A . B
2. (A +B)’ 4. A’+B’

17. විභාගය සඳහා විෂයයන් තෝරා ගැනීමේදී ඔබට ගණිතය විෂය(m) තෝරාගැනීම අනිවාර්‍ය වන අතර තොරතුරු තාක්ෂණය (i) සහ සෞඛ්‍ය විද්‍යාව (h) යන විෂයයන් දෙකෙන් එකක් තෝරාගැනීමට සිදුවේ. අපේක්ෂකයකු විෂයයන් තෝරා ගැනීම පහත සඳහන් කුමකින් පෙන්නුම් කෙරේද?

1. m OR (i OR h) 2. m AND (i AND h)
3. m OR (i AND h) 4. m AND (i OR h)

18. AB (A+B) ප්‍රකාශනය සුලු කිරීමේදී පිළිතුර වනුයේ

1. A . B 2. A + B 3. A’ + B’ 4. A + B’

19. NOT තර්කය පෙන්නුම් කරනුයේ පහත දැක්වෙන කුමන ගේට්ටුවෙන්/ ගේට්ටුවලින්ද?



1. A පමණි 2. B සහ C පමණි 3. A සහ C පමණි 4. ඉහත සියල්ලම

20. මෙම රූප සටහන සඳහා ගැළපෙන බූලීය ප්‍රකාශනය වන්නේ




1. X . X’ = 1 2. X + X’ = 1
3. X + 1 = 1 4. X . 1 = 1

21. මෙගා බයිට(MB) 16 සමාන වන්නේ

1. කිලෝ බයිට (Kb) 1 x $2^{13}$ 2. කිලෝ බයිට (Kb) 2 x $2^{13}$
3. බයිට (Bytes) 1 x $2^{22}$ 4. බයිට (Bytes) 4 x $2^{24}$

22. කවුළු (Windows) වැසීම සඳහා පහත දැක්වෙන කුමන යතුරු සංයෝජනය යොදා ගනීද ?

1. Ctrl + Alt + Esc 2. F8 3. Ctrl + W 4. Shift + Break

23. ViciCalc, Lotus123, Open office Calc, GNOME desktop යන ඒවා උදාහරණ වන්නේ

1. වදන් සැකසුම් යෙදවුම් වලටය 2. පැතුරුම්පත් යෙදවුම් වලටය
3. ප්‍රදර්ශන මෘදුකාංග වලටය 4. සංවර්ධන මෘදුකාංග වලටය

24. වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන්පහත දැක්වෙනව පළවෙනි වස්තුව දෙවෙනි වස්තුව ලෙස වෙනස් කරන්නේ කෙසේද?





1. දකුණට $180^0$ ක් කරකැවීම භාවිතා කරමින් 2. වමට $90^0$ ක් කරකැවීම භාවිතා කරමින්
3. සිරස් අතට උඩු ගැස්වීම භාවිතා කරමින් 4. තිරස් අතට උඩු ගැස්වීම භාවිතා කරමින්

25. පාඨයක (Text) එකෙල්ල කිරීම සඳහා කුමන කෙටි මාර්ග යතුරු(Short Cut Keys) භාවිතා කෙරේද?

1. Ctrl + C 2. Alt + C 3. Ctrl + E 4. Alt + E

ictnotes.org

26. C1 සිට C5 දක්වා ඇති 5 ගුණන වගුව සොයා ගැනීම සඳහා පහත දැක්වෙන ඉලෙක්ට්‍රොනික වැඩපත යොදා ගනී. C1 සඳහා යෙදිය යුතු සූත්‍රය වන්නේ




1. = A1*B1
2. = $A1*B1
3. = A$1*B1
4. = A1*$B$1

27. ඉලෙක්ට්‍රොනික පැතුරුම්පත් මෘදුකාංග තුල පහත දැක්වෙන සූත්‍ර යෙදීමෙන් අනුපිළිවෙලින් ලබා ගත හැකි ප්‍රතිදානය කුමක්ද ? = power(2,3) = mod(-5,2)

1. 8 , 1
2. 8 , -1
3. 9 , 0
4. 9 , error

28. ඔබ ඉලෙක්ට්‍රොනික වැඩපතකට පහත දැක්වෙන කුමන ප්‍රකාශය ඇතුලත්කළ විට ද එහි ප්‍රතිඵලය සත්‍ය(True) වන්නේ

1. = 7 > 7
2. = 8 ≠ (2 + 3 + 4)
3. AND (5 <>-5 ,5 = -5)
4. OR (5 <>-5 , 5= -5)

29 පහත දැක්වෙන ප්‍රස්තාරය අර්ථවත් වීමට වඩාත් සුදුසුම ප්‍රකාශය කුමක්ද ?




1. ආවලි(Series) නම් කරන්න.
2. විස්තර පාඨය(Legend) ඉවත් කරන්න.
3. x අක්ෂයේ මාතෘකාව වෙනස් කරන්න.
4. විස්තර පාඨය(Legend) දකුණට මාරු කරන්න.

30. සම්බන්ධතා දත්ත සමුදාය(Relational Database) දත්ත සමුදාය (Database)තුල භාවිතා වන එක් ආකෘතියක් වේ. මෙහිදී ***relation*** යන්නෙන් අදහස් කරන්නේ

1. වගු (Table)
2 විමසුම් (Queries)
3. සම්බන්ධතාවය(Relationship)
4 වාර්තා (Reports)

31 සම්බන්ධතා දත්ත සමුදාය(Relational Database) සම්බන්ධ පහත සඳහන්ප්‍රකාශ සලකා බලන්න ;

A- සම්බන්ධතාවයක් යනු දත්ත සමුදායන් 2 ක් හෝ කීපයක්අතර එahahiඅභි සම්බන්ධතාවයකි ;
B- සම්බන්ධතා දත්ත සමුදාය තුල ඇති සම්බන්ධතා ආකාර1:1 ,1 :n හා n:m වේ ;
C- සම්බන්ධතා දත්ත සමුදායක විවිධ වගු අන්තර්ගතවේ ;

ඉහත කිනම් ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

1. A පමණි
2. B පමණි
3. B හා C පමණි
4. ඉහත සියල්ලම නිවැරදිය

32 දත්ත සමුදායක් සඳහා පාසලක නමක් ඇතුල් කිරීමේදී Text යන දත්ත ප්‍රරූපය වෙනුවට Memo භාවිතා කිරීමේ අවශ්‍යය පෙන්නුම් කරන ප්‍රකාශය කුමක්ද?

1. නමක් සමඟ අකුරු ඕනෑම සංඛ්‍යාවක් ඇතුලත් කළ හැක.
2. කැපිටල් අකුරින් නම් ඇතුලත් කළ නොහැක.
3. සිම්පල් අකුරින් නම් ඇතුලත් කළ නොහැක.
4. පරිගණක මතකය අනවශ්‍ය ලෙස බෙදී යයි.

33. අමාලිට ඇය ගේ පරිගණකයේ පුළුල් තිරය යොදාගනිමින් විද්‍යුත් සමර්පනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. මේ සඳහා සුදුසුම දැක්ම(View) කුමක්ද?

1. Normal View
2. Slide Master View
3. Slide show View
4. Slide shorter View

ictnotes.org

34. පරිගණක සම්පත් හුවමාරු කර ගැනීම , ක්‍රියාකාරිත්වයන්ගේ සම්බන්ධීකරණය හා කළමනාකරණය සඳහා පහත දැක්වෙන කුමක් වැදගත් වේද ?

1. යෙදුම් මෘදුකාංග
2. මෙහෙයුම් පද්ධතිය
3. චිත්‍රක පරිශීලක අතුරුමුහුණත
4. පද්ධති උපයෝග

35. මෙහෙයුම් පද්ධති පිළිබඳ සලකා බැලීමේදී පහත කුමන ප්‍රකාශ සත්‍ය වේද?

A- දෘඩාංග හා මෘදුකාංග කළමනාකරණය පාලනයට මෙහෙයුම් පද්ධතියක් අවශ්‍ය වේ
B- ලිනක්ස් විවෘත මුලාශ්‍ර මෙහෙයුම් පද්ධතියකි
C- මෙහෙයුම් පද්ධතියක් යෙදවුම් මෘදුකාංගවලට අයිතිවේ

1. A පමණි
2. B පමණි
3. A සහ B පමණි
4. A සහ C පමණි

36. අන්තර්ජාලයේ වේගය මැනීම සඳහා පහත දැක්වෙන කිනම් ඒකකය භාවිතා කරයි ද ?

1. Hz
2. MB
3. MBps
4. Mbps

37. දත්ත රැගෙනයාම සඳහා භාවිතා නොකරන මෙවලමකි

1. සසම්භාවී ප්‍රවේශ මතකය (RAM)
2. සැනෙලි ධාවකය(Flash Drive)
3. Blu-ray තැටි
4. සංඛ්‍යාංක බහුවිධ තැටි(DVD)

38. ශිෂ්‍යයකුට අවශ්‍ය කරනවා 1040MB සහ 200MB ප්‍රමාණයෙන් යුත් විවෘත මුලාශ්‍ර 2 ක් ඔහුගේ මිතුරෙකුට යැවීමට ඔහු අදහස් කරයි. මෙම මෘදුකාංග 2 කම 2 GB සැනෙලිධාවකයක(Flash Drive)ගබඩා කිරීමට සැනෙලි ධාවකයේ (Flash Drive) ධාරිතාවයෙන් 50% ක් දැනටමත් පිරී ඇතයි උපකල්පනය කරන්න. ඉහත මෘදුකාංග ගබඩා කිරීම සම්බන්ධයෙන් සැනලි ධාවකයේ පවතින ඉඩ ප්‍රමාණය පිළිබඳ දැක්වෙන සත්‍ය ප්‍රකාශය කුමක්ද?

1. මෘදුකාංග 2 කම ගබඩා කළ හැක
2. මෘදුකාංග දෙකෙන් ඕනෑම එකක් තැන්පත් කළ හැක.
3. 200MB මෘදුකාංගය පමණක් තැන්පත් කළ හැක.
4. මෘදුකාංග කිසිවක් තැන්පත් කළ නොහැක.

39. පරිගණකයක ඇති ගොනු සම්බන්ධයෙන් සලකා බැලීමේදී වැරදි අදහසක් දැක්වෙන කියමන කුමක්ද ?

1. ගොනු නාමයන් වෙනස් කළ හැක
2. Files සංවිධානාත්මක ආකාරයෙන් තැන්පත් කිරීමට ගොනු භාවිතා කරයි
3. එක ගොනුවක තැන්පත් කළ හැක්කේ එකම වර්ගයේ files පමණි
4. එක ගොනුවක උප ගොනු කීපයක් තිබිය හැක ¡

40 MP4 ගීත අසීමට පහත දැක්වෙන ඒවායින්අවශ්‍ය නොවන දෙය කුමක්ද ?

1. ශබ්ද කාඩ්පත- (Sound Card)
2. අන්තඃජාලය-(Intranet)
3. මාධ්‍ය ධාවකය -(Media Player)
4. ස්පීකරය-(Speaker)

ictnotes.org

සියළුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2
## Model Paper - 2

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - (80) 11- පත්‍රය
## Information and Communication Technology- (80) Paper - 11

**කාලය පැය දෙකයි.** **Two Hours.**

**විභාග අංකය ..................** **Index No: ...............**

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙකුත් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01). කෙටි හා නිශ්චිත පිළිතුරු සපයන්න.

i. පරිගණක එහි පරම්පරා අනුව වර්ගීකරණය කර ඒවායේ භාවිත කර ඇති තාක්ෂණය ලියා දක්වන්න.

ii. කිලෝ බයිට 8 ක ඇති බිටු සංඛ්‍යාව අෂ්ටක සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න.

iii. පහත දක්වා ඇත්තේ සංඛ්‍යාවක් ඔත්තේ (odd)/ඉරට්ටේ (even) බව සොයා ගැනීම සඳහා සකස් කළ ව්‍යාජ කේතයකි. එය ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න.

```
Begin
        Input  X
        IF X mod 2 = -----  Then
                Print  "X Is  ------ number"
        Else
                Print  "X Is  ------ number"
        Endif
End
```

iv. පහත දී ඇති තාර්කික පරිපථයෙහි ප්‍රතිදානය F හි, අගය දැක්වීමට සුදුසු නිවැරදි බූලීය ප්‍රකාශන දෙකක් ලියා දක්වන්න.




v. පරිගණක ජාල (Computer Network) ගත කිරීමේ වාසි සහ අවාසි දෙක බැගින් නම් කරන්න.

vi. පහත දී ඇති ඡේදයේ A, B, C ලෙස දක්වා ඇති හිස් තැන් වරහන් තුල දී ඇති වගන්ති වලින් හෝ ඔබේ දැනුම භාවිතයෙන් සම්පූර්ණ කරන්න.

චිත්‍රක සංස්කරණ මෘදුකාංග - (Graphic editing software) භාවිතයෙන් ඡායාරූපයක් සංස්කරණය කරන විට එහි එක් ස්ථානයක ඇති වර්ණ හෝ හැඩ වෙනත් ස්ථානයකට ගැනීම සඳහා.........A……(Healing brush tool / Crop tool / Magic wend tool ) භාවිත කරනු ලබයි. මෙම නිර්මාණය වෙබ් පිටුවකට ඇතුලත් කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ එය .........B..........(Bmp / Jpeg / Psd) දිගුව-(Extention) සහිත චිත්‍රක ගොනුවක් ලෙස සුරැකීම -(Save)ය. අන්තර්ජාලය තුල වැඩියෙන්ම භාවිත වන චිත්‍රක ගොනු ආකෘතිය.......C........ය.

vii. කැතෝඩ කිරණ නල සංදර්ශකය (CRT Monitor) සහ ද්‍රව ස්ඵටික සංදර්ශකය (LCD Monitor) අතර ඇති වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.

viii. කාණ්ඩ සැකසුම් පද්ධතියක් (Batch Processing System) තත්‍ය කාල සැකසුම් පද්ධතියකින් (Real Time Processing System) ප්‍රධාන වශයෙන් වෙනස් වන්නේ කෙසේද?

ix. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමේදී හස්තීය (Manual) ක්‍රම යොදා ගැනීමට වඩා පරිගණක ගත තොරතුරු පද්ධතියක් භාවිත කිරීමෙන් ඇති වන වාසි දායක තත්වයන් දෙකක් සඳහන් කරන්න.

ictnotes.org

x. සසම්භාවී ප්‍රවේශ මතකය යනු කුමක්දැයි පැහැදිලි කර ගතික සසම්භාවී ප්‍රවේශ මතකය හා ස්ථිතික සසම්භාවී ප්‍රවේශ මතකය අතර ඇති වෙනස්කම් දෙකක් ලියා දක්වන්න.

(02). ඕලුගම මහා විද්‍යාලයේ ආපන ශාලාවේ අලෙවි කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික පැතුරුම්පත් භාවිතා කෙරේ. මෙම ආපන ශාලාවෙන් තොග වශයෙන් මිලට ගන්නා කෑම සහ බීම සඳහා වට්ටමක් දෙනු ලැබේ.පහත දක්වා ඇත්තේ පාසලේ ක්‍රීඩා උත්සවයේ කිරි පැකට් අලෙවිය සඳහා යොදාගත් වැඩ පතක කොටසකි .කිරි පැකට් 100 ක් හෝ ඊට වැඩිපුර මිළට ගන්නා විට 5% ක වට්ටමක් දෙනු ලැබේ. කිරි පැකට් එකක මිළ C2 කෝෂයේ ද වට්ටම C3 කෝෂයේ ද සඳහන් වේ.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | **ඕලු ආපන ශාලාව** | | | | |
| 2 | **කිරි පැකට් එකක මිළ** | | **Rs20.00** | | |
| 3 | **වට්ටම** | | **5%** | | |
| 4 | **මිලට ගත් අය** | **මිලට ගත් කිරි පැකට් ගණන** | **අයවිය යුතු මුදල** | **වට්ටම** | **ගෙවූ මුදල** |
| 5 | පැරකුම් නිවාසය | 100 | Rs2,000.00 | Rs100.00 | Rs1,900.00 |
| 6 | මහින්ද නිවාසය | 225 | Rs4,500.00 | Rs225.00 | Rs4,275.00 |
| 7 | තිස්සනිවාසය | 500 | Rs10,000.00 | Rs500.00 | Rs9,500.00 |
| 8 | විජය නිවාසය | 750 | Rs15,000.00 | Rs750.00 | Rs14,250.00 |
| 9 | ගැමුණු නිවාසය | 75 | Rs1,500.00 | Rs0.00 | Rs1,500.00 |
| 10 | | | | **ගෙවූ මුලුමුදල** | Rs31,425.00 |

i. මිළට ගත් කිරි පැකට් සඳහා අයවිය යුතු මුදල ගනණය කිරීම සඳහා **C5** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය සඳහන් කරන්න. (මෙම සූත්‍රය **C6:C9** පරාසයට පිටපත් කළ විට C තීරුවේ සඳහන් ඊට අදාළ අගයයන් ලැබිය යුතුය.)

ii. කෝෂ ලිපින පමණක් භාවිතා කර වට්ටම ගනණය කිරීම සඳහා **D5** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය සඳහන් කරන්න. (මෙම සූත්‍රය **D6:D9** පරාසයට පිටපත් කළ විට Dතීරුවේ සඳහන් ඊට අදාළ අගයයන් ලැබිය යුතුය.)

iii. කෝෂ ලිපින පමණක් භාවිතා කර ගෙවූ මුදල ගනණය කිරීම සඳහා **E5** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය සඳහන් කරන්න. (මෙම සූත්‍රය **E6:E9** පරාසයට පිටපත් කළ විට Eතීරුවේ සඳහන් ඊට අදාළ අගයයන් ලැබිය යුතුය.)

iv. **E10** කෝෂයට ගෙවූ මුළු මුදල ගනණය කිරීම සඳහා භාවිත කල හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.

(03). (a) පහත රූප සටහන භාවිත කරමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




ictnotes.org

(i) ඉහත HTML ලේඛනයේ "Colombo is the largest city of Srilanka"යන්න ඒරියල් අකුරු වර්ගය, අකුරු ප්‍රමාණය 7 සහ නිල් පැහැයෙන් හැඩගුරු ගැන්වීමට අවශ්‍යව ඇත. ඒ සඳහා අවශ්‍ය HTML කේත ඛණ්ඩය ලියා දක්වන්න.

(ii) ඉහත HTML ලේඛනය තුල පහත දැක්වෙන කේත ඛණ්ඩය මගින් ඇති කරන බලපෑම විස්තර කරන්න. <img src="pen.jpg">

(iii) "Places to visit in Sri Lanka" යන ශීර්ෂය සහිතව ඉන් පහත ඇති නගර HTML ලේඛනයට ඇතුළත් කිරිමට අවශ්‍ය HTML කේත ඛණ්ඩය ලියා දක්වන්න.

(b). HTML ලේඛනයක් සම්බන්ධයෙන් මූලාංග (tags) සහ උපලක්ෂණ (attributes) යන පද විස්තර කරන්න.

(04). දත්ත සමුදායක ඇති වගු වල ක්ෂේත්‍ර ප්‍රමාණය වැඩි වීමත් සමග දත්ත වාර්තා ඇතුලත් කිරීමේ දී විවිධ ගැටලු මතුවේ. මෙම ගැටලු හඳුනා ගනිමින් ඒවා අවම කිරීම සඳහා සම්බන්ධක දත්ත පාදක ආකෘති යොදා ගැනේ. සම්බන්ධක දත්ත සමුදාය ආකෘතියක පොදු අනුලක්ෂණයන් ගෙන් යුතු දත්ත සමූහයක් එකිනෙකට සම්බන්ධ වගු කිහිපයක ඇතුලත් කර ඇත.

ශිෂ්‍යයෙක් දත්ත සමුදායකයක ඇති පැතලි ගොනුවක් (Flat file), සම්බන්ධක දත්ත පාදක වගු දෙකකට බෙදා වෙන් කර ගත් ආකාරය පහත දැක්වේ.

Student Table - පැතලි ගොනු වගුව(Flat file)

| Admission Number | Name | DOB | Sex | Index No | Total Marks | Rank | Class |
|---|---|---|---|---|---|---|---|
| 2100 | A.B.Kumara | 12/1/98 | M | 210090 | 589 | 5 | 10-A |
| 2101 | B.C.Kumari | 17/5/97 | F | 210191 | 725 | 3 | 10-C |
| 2102 | C.D.Rangana | 23/6/96 | M | 210292 | 749 | 2 | 10-B |
| 2103 | D.E.Ranganee | 14/8/97 | F | 210393 | 782 | 1 | 10-B |
| 2104 | E.F.Manori | 12/9/97 | F | 210494 | 698 | 4 | 10-D |

Student Table - ශිෂ්‍ය වගුව

| Admission Number | Name | DOB | Sex |
|---|---|---|---|
| 2100 | A.B.Kumara | 12/1/98 | M |
| 2101 | B.C.Kumari | 17/5/97 | F |
| 2102 | C.D.Rangana | 23/6/96 | M |
| 2103 | D.E.Ranganee | 14/8/97 | F |
| 2104 | E.F.Manori | 12/9/97 | F |

Result Table - ප්‍රතිඵල වගුව

| Index No | Total Marks | Rank | Class |
|---|---|---|---|
| 210090 | 589 | 5 | 10-A |
| 210191 | 725 | 3 | 10-C |
| 210292 | 749 | 2 | 10-B |
| 210393 | 782 | 1 | 10-B |
| 210494 | 698 | 4 | 10-D |

i. පැතලි ගොනු වගු තුල දත්ත ගබඩා කිරීමේදී ඇතිවන ගැටලු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. දත්ත පාදක වගුවක ප්‍රාථමික යතුර (Primary key) යනු කුමක්ද ?

iii. සම්බන්ධක දත්ත පාදක වගු ලෙස සකස් කර ගත් ශිෂ්‍ය වගුව සහ ප්‍රතිඵල වගුව සැලකූ විට, ප්‍රතිඵල වගුවේ ඇති දත්ත වාර්තාවකින් ඒ ඒ විභාග අංක යටතේ පෙනී සිටි සිසුන් කවුරුන්ද යන්න සොයා ගත නොහැක. මෙම දුර්වලතාව මග හැරවීම සඳහා ප්‍රතිඵල වගුවේ සිදු කල යුතු වෙනස්කම සඳහන් කර එය නිවැරදිව නැවත අඳින්න.

iv. ඔබ ඉහත අඳින ලද ප්‍රතිඵල වගුව ඇසුරෙන් ආගන්තුක යතුර (Foreign key) යන්න පැහැදිලි කරන්න.

v. ශිෂ්‍ය වගුවේ සඳහන් ක්ෂේත්‍ර හතර සඳහා එක් එක් ක්ෂේත්‍රය නිරූපණය කිරීමට වඩාත්ම සුදුසු දත්ත ප්‍රරූප (Data types) මොනවාද ?

(05). (a) තැපැල් මහතෙකු ඔහුට අයත් ප්‍රදේශයේ බෙදීමට ඇති ලියුම් ගණන අනුව අදාළ නිවෙස් ප්‍රමාණය සඳහා ලිපි බෙදීම සිදු කරයි. ලිපි බෙදිය යුතු නිවෙස් කරා යන ඔහු නිවසේ සිටින පුද්ගලයෙකුට ලිපි භාර දෙයි. නිවසේ කිසිවෙක් නොසිටිය හොත් නිවසේ ගේට්ටුවේ සවි කර ඇති පෙට්ටියට ලිපි දමනු ලබයි. නිවසේ පුද්ගලයෙකු නොසිටියේ නම් හෝ ලිපි දැමීමට පෙට්ටියක් නොමැති නම් පසු දින නැවත බෙදා දීම සඳහා ආපසු තැපැල් කාර්යාලයට භාර දෙයි.

මෙම සංසිද්ධිය නිරූපණය කිරීමට අදාල ඇල්ගොරිතමය සඳහා වූ ගැලීම් සටහන(Flow chart) පහත දැක්වේ. එහි a සිට g දක්වා හිස්තැන් පිරවීමට සුදුසු වචන/වගන්ති ලියා දක්වන්න.

❖ දිනකට බෙදා දීමට ඇති ලිපි ගණන N ලෙස සලකන්න.

ictnotes.org




(b).i 1සිට 10 දක්වා අනුයාත සංඛ්‍යාවල වර්ගය මුද්‍රණය කිරීම සඳහා සුදුසු ගැලීම් සටහනක් අඳින්න.

ii ගැලීම් සටහනේ දක්වා ඇති තර්කයට අදාළ ව්‍යාජ කේතය ලියන්න.

(06). දේශීය හා විදේශීය පාරිභෝගිකයින් අරමුණු කර ශාක සාර ඖෂධීය පාන නිපදවන්නාවූ ''හෙළ ඔසු පැන්'' සමාගම මාර්ගගත-(Online) ව්‍යාපාරයක් ලෙස දෙස් විදෙස් අළෙවි සැල් ජාලයක් හරහා නිෂ්පාදන අළෙවියෙහි යෙදී සිටියි. මේ සඳහා ඔවුන් සතුව අන්තර්ජාලය පදනම් කරගත් තොරතුරු පද්ධතියක් ඇත. එය නිර්මාණය කර, නඩත්තු කරනු ලබන්නේ "ලංකා සොෆ්ට්" නැමති මෘදුකාංග සමාගම විසිනි.

i. ආයතනයක් තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාමේදී එය නඩත්තු කිරීමේ අවශ්‍යතාව ඇතිවීමට හේතු වන කරුණු දෙකක් ලියන්න.
ii. මෙම තොරතුරු පද්ධතිය අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාත්මක වේ නම් එයට සහ බද්ධ කරගත යුතු වඩාත් සුදුසු දත්ත සමුදාය මෘදුකාංගයක් නම් කරන්න.
iii. "අන්තර්ජාලය භාවිතයෙන් වෙළඳ කටයුතු සිදු කිරීම ආර්ථික වශයෙන් මෙන්ම පරිපාලනමය වශයෙන්ද විශාල වාසි අත්වේ." මෙම ප්‍රකාශය සනාථ කිරීමට කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.
iv. ඖෂධ පිළිබඳව වෙළඳ ප්‍රචාරණයට අමතරව, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුල තොරතුරු තාක්ෂණය යොදා ගන්නා අවස්ථා 04 ක් නම් කරන්න.
v. පරිගණක භාවිතයේදී නිවැරදි ඉරියව් යොදා නො ගැනීම නිසා ඇති විය හැකි ගැටලු සහගත තත්වයන් 02ක් ලියා දක්වන්න.

(07). පහත දැක්වෙන මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i පරිගණක වයිරස
ii රාජ්‍ය ආයතන පරිගණක ගත කිරීමේ වැදගත්කම
iii තොරතුරු සංනිවේදන තාක්ෂණ මගින් ජාතීන් අතර සුහදතාවය වර්ධනය කරයි
iv මාර්ග ගත සාප්පු සවාරිය (Online Shopping)

ictnotes.org